රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 1/89(II).

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,
1991 අගෝස්තු මස 23 වෙනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවල
ලේකම්වරුන් හා දිසාපතිවරුන් වෙත.

පළාත් පාලන ආයතනවලට සහ පළාත් සභාවලට
තේරී පත්වන රාජ්‍ය නිලධාරීහු.

1989.01.05 දිනැති අංක.1/89 හා 1991.04.23 දිනැති අංක.1/89 (1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ වලින් සංශෝධනය කරන ලද ආයතන සංග්‍රහයේ XXII වැනි පරිච්ඡේදයේ 2:3:2 හා 3:7 වගන්ති ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් වගන්ති ආදේශ කරන්න.

(I) " 2:3:2 නිලධාරියකු, ජනාධිපති තේරීමකදී, පාර්ලිමේන්තු මැතිවරණයකදී හෝ පළාත් සභා මැතිවරණයකදී අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වීමට බලාපොරොත්තු වන්නේ නම්, ඔහු විසින් ඒ බව නාම යෝජනා පත්‍ර භාරගන්නා දිනට, යටත් පිරිසෙයින් දින 10 කට වත් කලින් දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලිඛිතව දැන්විය යුතුය. නාම යෝජනා පත්‍ර භාරගන්නා දිනට, සතියකට පෙර සිට මැතිවරණ දිනය දක්වා වූ කාලසීමාව සඳහා ඔහුට පඩි රහිත නිවාඩු දිය යුතුය. එසේ වුවද නිලධාරියකු පළාත් පාලන මැතිවරණයකදී අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වීමට බලාපොරොත්තු වන්නේ නම් ඔහු විසින් ඒ බව නාම යෝජනා පත්‍ර භාරගන්නා දිනට, දින එකකට වත් කලින් දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලිඛිතව දැන්විය යුතුය. එදින සිට මැතිවරණ දිනය දක්වා වූ කාලසීමාව සඳහා ඔහුට පඩිරහිත නිවාඩු දිය යුතුය. එහෙත් මැතිවරණයකට තරඟ කරන දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධාරියකු නිවාඩු ඉල්ලුම් කරන වසරේදී, ඔහුට හිමි මෙතෙක් ලබා නොගත් සාමාන්‍ය නිවාඩු වේ නම්, ඒවා ලබා ගැනීමට ඔහුට පුළුවන."

(II) "3:7 දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකම් ඇති නිලධරයකු පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබුවහොත් ඔහු එසේ තේරී පත්වී සිටින පළාත් පාලන ආයතනයේ කාර්යාලයට ආසන්න සේවා ස්ථානයක සේවය කිරීමේ අනුග්‍රහය සේවයේ අවශ්‍යතාවයන්ට සහ විනය අවශ්‍යතාවයන්ට යටත්ව, ඔහුට ලබා දිය යුතුය. එම පළාත් පාලන ආයතනයේ සභිකයෙකු වශයෙන් සේවය කරන තාක් ඔහු සාමාන්‍ය ස්ථාන මාරු කිරීම්වලට යටත් නොවන්නේය."

( ආර්. අබේරත්න )